# ශ්‍රී ලාංකේය සමාජයේ සියදිවි නසාගැනීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය

## (වසර 2014-2016 කාලය තුළ පොලිස් අපරාධ වාර්තාවන්ට අනුව)

උඩුගම්පළ ගුණානන්ද හිමි[1], මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි[2]

### හැඳින්වීම

සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාව නූතනය වන විට ආර්ථික, දේශපාලනික, ජාතික, ආගමික හා සංස්කෘතික අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී. එම අභියෝග හමුවේ මානව සමාජයේ අපේක්ෂාවන් බිඳ වැටීමේ ප්‍රවණතාවය වැඩි වී තිබේ. විශේෂයෙන් මෙවන් පසුබිමක් තුළ මිනිසුන් අවසන් වශයෙන් තීරණය කරන්නේ සියදිවි නසාගැනීම වැනි සාහසික ක්‍රියාවන් සිදු කරගැනීමටයි.සියදිවි නසාගැනීම යනු සරල ලෙසින් දක්වුවහොත්තම ජීවිතය තමන් අතින්ම තොර කර ගැනීමයි. සියදිවි නසාගැනීම සම්බන්ධයෙන් ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයෙකු වූ එමිල් ඩුර්කයිම් (Emil Durkhiem)පෙන්වා දෙන්නේ“ප්‍රතිඵලය ස්ථිර වශයෙන් ම දැනගෙන මරණයට පත්වන පුද්ගලයා විසින්ම යොදාගත් ප්‍රතිජානනාත්මක හො නිෂේධනාත්මක ක්‍රියාවක් මඟින් සිදුවන මරණයයි”මෙම අතිබිහිසුණු ක්‍රියාවලිය දළ වශයෙන් ලෝකයේ මිනිසුන් ලක්ෂ 8-10 ත් අතර සිදුකරගන්නාබවට ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙයි. ලෝකයේ සෑම තප්පර හතළිහකට වරක් සියදිවි හානි කරගැනීමක් සිදුවන අතර ලෝකය පුරා සිදුවන මරණවලින් සියයට 1.3ක්ම සිදුවන්නේ සියදිවි නසාගැනීමෙන් බව වාර්තා වේ. ලෝකයේ රටවල් සමග සසදා බැලීමේ දී ශ්‍රී ලංකාව සියදිවි නසාගැනීම් අතරින් මුල් තැනගෙන තිබෙන ආකාරයක් දැකිය හැකිය. 1985 - 2015 දක්වා වසර 30ක් තුළ ලෝකයේ සියදිවි නසා ගැනීම්වල සංඛ්‍යා දත්ත ඇසුරින් විකීපීඩියාව දක්වන්නේ රටවල් 107 ක් අතරින් ලංකාව 7 වැනි තැනට පත්ව ඇති බවයි. ලෝක සෞඛ්‍ය සංවිධානය 2012 වසරේ නිකුත් කරන ලද වාර්තාවට අනුව සියදිවි නසාගැනීම අතින් ලංකාව ලෝකයෙන්ම තුන්වැනි ස්ථානයේ පසුවන බව පෙන්වා දී ඇත. 2015 වර්ෂයේ වාර්තාවේ දී ලංකාව 4 වන ස්ථානයට පත්ව තිබේ.සිය දිවි නසාගැනීම සමාජ ප්‍රශ්නයක් ලෙස දැකිය හැක්කේ 100,000 (ලක්ෂය) කට 10ක් ඉක්මවා සියදිවි නසාගන්නේ නම් ය. ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීමේ ප්‍රතිශතය 2016 වසරේ දී 14.5%ක් ලෙසින් පොලිස් වාර්තාව දෙස බැලීමේ දී හඳුනාගත හැකිය. එවැනි ඉහළ ප්‍රතිශතයකින් සියදිවි නසාගැනීම, ලාංකේය මානව

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල, අනුරාධපුර

[2] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල, අනුරාධපුර, mpannasekara@yahoo.com

සමාජ සංවර්ධනයේ පැවත්ම කෙරෙහි ගැටලු රාශියක් මතු කරනු ලැබේ. එම නිසා එම ගැටලුව පිළිබඳව අධ්‍යයනය කරීම හා සියදිවි නසාගැනිම සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂාව විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

ශ්‍රී ලාංකේය සමාජයේ සියදිවි නසාගැනීම සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික දත්ත ඇතුළත් ජන හා සංඛ්‍යා ලේඛණ වාර්තාව හා පොලිස් වාර්තාවන් උපයෝගි කරගන්නා ලදි. ඊට අමතරව සියදිවි නසාගත් පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයින් හා සියදිවි නසාගන්නට උත්සාහ කරන ලද පුද්ගලයින් සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් තොරතුරු ලබා ගත්හ. සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක දී භාවිතා කරන විශ්ලේෂණාත්මක ක්‍රම භාවිතයෙන් තොරතුරු විශ්ලේෂණය කර පර්යේෂණය සාර්ථක කරගන්නා ලදි.

**ප්‍රතිඵලය**

ශ්‍රී ලාංකේය සමාජයේ සියදිවි නසාගැනීම සඳහා බලපාන ලද සාධක පිළිබඳව අධ්‍යයනයේ දී සියදිවි නසාගැනීම සම්බන්ධයෙන් ලෝකයේ ඇති ප්‍රවණතාවයන් පිළිබඳව අධ්‍යයනය කරන්නට හැකිවිය. තවද සියදිවි නසාගැනීම් බහුල වශයෙන් සිදුවන රටවල සමාජ රටාව පිළිබඳව අධ්‍යයනය විය. වසර ගණනාවක් ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීමේ ප්‍රතිශතයන් අධ්‍යයනය කරන්නට හැකිවීමතවත් ප්‍රතිපලයකි. විශේෂයෙන් ශ්‍රී ලාංකේය සමාජයතුළ සියදිවි නසාගැනීම සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කරගන්නට හැකි වීම මෙම පර්යේෂණයේ වැදගත්ම ප්‍රතිඵලයයි. එමෙන්ම සියදිවි නසාගැනීමේ දී වැඩි වශයෙන් ශ්‍රී ලාංකිකයන් භාවිතා කරන ක්‍රම හා සියදිවි නසාගැනීමෙන් පුද්ගලයන් මුදවා ගන්නට ගත හැකි පියවරයන් අධ්‍යයනය කිරීමට හැකි විමද මෙම පර්යේෂණයේ ප්‍රතිඵලයන්ය.

**සාකච්ඡාව**

තමාගේ ජීවිතය තමා විසින්ම නැති කරගැනීමට නම් ඒ පුද්ගලයා තුළ මානසික වශයෙන් මහත් බිඳවැටීමක් සිදුවිය යුතුය. එසේම එය සමාජ අභ්‍යන්තරය තුළ මතුවන ගැටලුකාරී තත්ත්වයන් නිසා ඇති වන්නක් බව ඩූර්කයිම් පවසයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකේය සමාජයේ සියදිවි නසාගැනීම සඳහා සමාජ මෙන්ම මානසික ගැටලු බලපා ඇති බව පෙනේ. ඒ අනුව සියදිවි නසාගැනීමට ප්‍රධාන වශයෙන් බලපාන ලද හේතු ශ්‍රී ලංකා පොලිස් වාර්තාවට අනුවවසර 2014-2016 දක්වා සිදුවුණ සියදිවිනසාගැනීමට හේතුපිළිවෙළ මෙසේ දැක්විය හැකිය.

- පවුලේ හෝ ස්වාමියාගේ හිරිහැර
- නිදන්ගත රෝග හා කායික දුබලතා

- මානසික ආබාධ
- ප්‍රේම සම්බන්ධතා බිඳවැටීම්
- ආර්ථික ප්‍රශ්න (දුගීකම හා ණය ගැති බව)
- විෂ මත් ද්‍රව්‍ය ඇබ්බැහිවීම්
- වියපත් බව
- මව්පියන්ගේ හෝ ඥාතීන්ගේ මියයාම
- විරැකියා ප්‍රශ්න
- ප්‍රතිකාර ගැනීමට ඇති බිය.
- දේපළ හානි
- විභාග අසමත් වීම
- ලිංගික වශයෙන් ඇති අසමත්කම
- ලිංගික අපචාර

**පවුලේ හෝ ස්වාමියාගෙන් සිදුවන හිරිහැර**

ශ්‍රී ලංකාවේ සිදුව ඇති සියදිවි නසාගැනීම් සඳහා බලපාන ලද හේතු අධ්‍යයනය කරන විට හඳුනාගත හැකි ප්‍රධානම කරුණ වූයේ පවුලේ හෝ ස්වාමියාගෙන් සිදුවන හිරිහැර නිසා සියදිවි නසාගැනීම් බහුල බවයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් සංක්‍රමණ නිසා පවුලෙන් දුරස්වීමේන් ඇතිවන පාලුව, තනිකම, වැනි කාරණා ප්‍රධාන වන්නට ඇතැයි කර්නි සහ මිලර් විසින් ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීම වර්ධනය පිළිබඳව කරන ලද පර්යේෂණයෙන් පෙන්වා දී ඇත. එමෙන්ම වියපත් බවට පත්වීමත් සමග ඇතිවන හුදකලා බව පුරුෂ පාර්ශවයේ සියදිවි නසාගැනීට හේතු වී ඇත.

**නිදන්ගත රෝග හෝ කායික දුබලතා**

ශරීරයේ ඇති නිදන්ගත රෝග හෝ කායික දුබලතා දරාගත නොහැකිව බොහෝ දෙනෙක් සියදිවි නසාගෙන ඇති බව පොලිස් දෙපාර්තමේන්තුවේ 2014-2016 දක්වා වසරවල වාර්තාවලින් පැහැදිලි වේ. වස විෂ භාවිතාව වැඩි වීමත් සමග සියලු ආහාර වර්ග නිෂ්පාදනයේ දී වස භාවිතය අධික විය. මේ හේතුවෙන් විවිධ වර්ගයේ සුවපත් කළ නොහැකි ලෙඩ රෝග අධික වන්නට විය. බෝ නොවන රෝග බහුල වශයෙන් දැකිය හැකි කාලයක් වශයෙන් මෙම කාල සීමාව හඳුනාගත හැකිය.

මානසික ආබාධ

ශ්‍රී ලංකාවේ සිදුවන සියදිවි නසාගැනීම්වලට හේතු අධ්‍යයනයෙන් තෙවැනි කාරණාව ලෙසින් හඳුනාගෙන ඇත්තේ මානසික ආබාධ නිසා සියදිවි

නසාගැනීමයි. බොහෝ පුද්ගලයන් මේ තත්වයට පත්වන්නේ විෂාදය (Depression) නම් අවපීඩන මානසික පසුබිම හේතු කොට ගෙනය. මෙවැනි අවපීඩන මානසික තත්ත්වයකට ගොදුරුවන පුද්ගලයකු තුළ ජීවිතය පිළිබඳව කලකිරුණු ස්වභායක් ඇති වෙයි. එහිදී සියදිවි නසාගැනීමට උත්සාහ කරයි.

ප්‍රේම සම්බන්ධතා

තරුණ අයගේ සියදිවි නසාගැනීම්වලට ප්‍රධාන හේතුව වී ඇත්තේ ප්‍රේම සම්බන්ධතාවයන්ය. ප්‍රේම සම්බන්ධතාවල දී පුද්ගලයින් බලාපොරොත්තු වැඩි වශයෙන් ඇති කරගෙන කටයුතු කරනු දකී. එම බලාපොරොත්තු බිඳවැටීම නිසා ඇතිවන පීඩනයේ දී බොහෝ දුරට උත්සාහ කරන්නේ සියදිවි නසාගැනීමටයි. ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ සියදිවි නසාගැනීම්වලදී ප්‍රේම සබඳතා නිසා මියයන අයගේ සංඛ්‍යාව වැඩිය.

ආර්ථික ගැටලු

සියදිවි නසාගැනීමට බොහෝ සෙයින් ආර්ථික සාධක ද බලපා ඇති බව හඳුනාගත හැකිය. රැකියාවත් නොමැතිකම, ණයබර, දරිද්‍රතාවය නිසා බොහෝ අය එයින් ගැලවීමේ මාර්ගයක් ලෙස සියදිවි හානි කර ගනිති. ශ්‍රී ලංකාවේ ද සියදිවි නසාගැනීම සඳහා විරැකියාව හා දුගීකම තරමක් දුරට බලපා ඇති බව හඳුනාගෙන ඇත.

විෂ මත්ද්‍රව්‍ය භාවිතය හා අබ්බැහිවීම

විෂ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් අතර සියදිවි නසාගැනීම දෙයාකාරව සිදු වේ. එනම් සියදිවි හානි කරගැනීමේ අටියෙන් දිනෙන් දිනම විෂ මත්ද්‍රව්‍ය භාවිතය හා විෂ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවීම නිසා ඇතිවන කම්පා කළකිරීම් හෝ වෙනත් හේතූන් නිසා සියදිවි නැතිවී යාම යනුවෙනි.

නිගමනය

ශ්‍රී ලාංකේය සමාජයේ සියදිවි නසාගැනීම බහුල වන අතර එය ජාත්‍යන්තර මට්ටමෙන් බලන කල ඉතා ඉහළ මට්ටමක් බව හඳුනාගත් කරුණකි. විශේෂයෙන් සංවර්ධනය වන රටක් ලෙසට ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහි මෙම ගැටලුව ප්‍රබල ලෙසින් බලපානු ලැබේ. ඒ නිසා මෙවැනි සමාජ ප්‍රශ්නයක් නිර්මාණය වීමට බලපාන ලද හේතු වසර තුනක තොරතුරු අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි විය. පවුලේ හෝ ස්වාමියාගේ හිරිහැර, නිදන්ගත රෝග හා කායික දුබලතා, මානසික ආබාධ, ප්‍රේම සම්බන්ධතා බිඳවැටීම්, ආර්ථික ප්‍රශ්න (දුගීකම හා ණය ගැතිබව), විෂ මත් ද්‍රව්‍ය ඇබ්බැහිවීම් යනාදි ප්‍රධාන කාරණා ඒ අතරින් වැදගත්ය. මෙම හේතු කාරණා අප සමාජයේ පුද්ගල ජීවිත තුළ ගොඩ නැගී තිබෙන්නේ

විධිමත් සමාජ ක්‍රමයකට රාජ්‍ය මට්ටමෙන් පෞද්ගලික මට්ටමෙන් පිළිගත හැකි ක්‍රමවේදයක් නොමැති කම නිසාය. එම නිසා සමාජය සුඛවාදී ආකල්පවලින් පරිපූර්ණය කරනන්ට උත්සාහ ගත යුතුය. හඳුනාගත් මෙම හේතු කාරනා තුරන් කරන්නට සමාජ සංවිධාන ගොඩනගා ගෙන මිනිසුන්ගේ සෞඛ්‍ය ගැටලු, ආර්ථික ගැටලු, දේශපාලනික ගැටලු, අධ්‍යාපනික ගැටලු, මානසික ගැටලු විසඳීමට උත්සාහ කළ යුතු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීම හා සියදිවි නසාගැනීමට තැත් කිරීම අවම වී මානව ජීවතයට ප්‍රිය කරන සුඛවාදී ආකල්පයන්වලින් හා ක්‍රියාකාරීත්වයන්වලින් පූර්ණ වූ සමාජයක් ගොඩ නඟාගත හැකිය.

ප්‍රමුඛ පද : සමාජ ගැටලු, සියදිවි නසාගැනීම, හේතු සාධක, විසඳුම්

ආශ්‍රිත ග්‍රන්ථ

*ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තු වාර්තාව.* (2011).

*පොලිස් අපරාධ වාර්තාව*, 2014, 2015, 2016.

අමරසේකර, දයා. (2015). *ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න*, මරදානඃ සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, ස්වර්ණලතා. (2005). *සමාජ ප්‍රශ්න,* කතෘ ප්‍රකාශන.

Silva, Padmasiri. (1989). *Suicide in Sri Lanka*. Kandy: Institute of Fundamental Studies.

Thalagala, N. (2009). *Suicide Trend in Sri lanka 1880-2010*: Social demographic and geographical variations, Colombo: Journal of the college of community physicians of Sri Lanka.